ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,393— 2005 මැයි මස 13 වැනි සිකුරාදා— 2005.05.13

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

තනතුරු — ඇබෑර්තු

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම

(අ) සම්බන්ධීකරණ හා තොරතුරු නාක්ෂණ සහකාර - තනතුරු 02
(ආ) විමර්ශණ සහකාර - තනතුරු 02
(ඇ) පර්යේෂණ සහකාර - තනතුරු 01
(ඈ) දත්ත කළමණාකරණ සහකාර - තනතුරු 02
(ඉ) ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදක සහකාර - තනතුරු 01

01. ඉහත තනතුරුවලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලනු ලබන ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *වයස් සීමාව.*– ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ සංස්ථා/මණ්ඩලවල සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

03. *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් :*
පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාලත් උපාධියක් තිබීම,
ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම,
පසුගිය වසර 03 ඇතුළත කිසිදු ආකාරයක විනය විරෝධී හැසිරීමක් සඳහා දඬුවම් ලබා නොතිබීම.

විශේෂ සුදුසුකම් :

(අ) සම්බන්ධීකරණ හා තොරතුරු නාක්ෂණ සහකාර .–
(i) තොරතුරු තාක්ෂණය/පරිගණක තාක්ෂණය විෂයයක් වශයෙන් හදාරා පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සාමාන්‍ය උපාධියක් හෝ විශේෂ උපාධියක් ලබා තිබීම.
(ii) ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් වේ.

(ආ) විමර්ශණ සහකාර :
(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් හෝ විශේෂ උපාධියක් ලබා තිබීම.
(ii) ක්ෂේත්‍ර රාජකාරිවල නිරතවීමේ හැකියාව හා වෙනත් භාෂා පිළිබඳ දැනුමක් තිබීම වඩාත් ප්‍රයෝජනවත් වේ.
(iii) ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් වේ.

(ඇ) පර්යේෂණ සහකාර :
(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් හෝ විශේෂ උපාධියක් ලබා තිබීම.
(ii) ක්ෂේත්‍ර රාජකාරිවල නිරතවීමේ හැකියාව හා වෙනත් භාෂා පිළිබඳ දැනුමක් තිබීම වඩාත් ප්‍රයෝජනවත් වේ.
(iii) ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් වේ.

(ඈ) දත්ත කළමණාකරණ සහකාර :
(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් සාමාන්‍ය උපාධියක් හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. (ව්‍යාපාර සංඛ්‍යානය විෂයයක් ලෙස හදාරා තිබිය යුතු ය.)
(ii) ක්ෂේත්‍ර රාජකාරිවල නිරතවීමේ හැකියාව හා වෙනත් භාෂා පිළිබඳ දැනුමක් තිබීම වඩාත් ප්‍රයෝජනවත් වේ.
(iii) භාණ්ඩ ආනයනයට අදාල ආයතනවලට ගොස් අවශ්‍ය තොරතුරු සපයා ගැනීමේ හැකියාව.
(iv) ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් වේ.

(ඉ) ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදක සහකාර :
(i) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සාමාන්‍ය උපාධියක් හෝ විශේෂ උපාධියක් ලබා තිබීම.
(ii) ඉංග්‍රීසි සහ දෙමළ භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් වේ.

04. *වැටුප් කාණ්ඩය හා පරිමාණය :*
(වාර්ෂිකව) රු. 1,26,600 - 6 × 1,560 - 8 × 2,220-5 × 3,480 - රු. 1,71,120
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 9/2004 හි ඊබී - 2-5-2

05. *බඳවා ගැනීමේ ක්‍රමය.*– සුදුසුකම්ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසු ස්ථිර තනතුරට බඳවා ගනු ලැබේ.

අයදුම් කළ යුතු ක්‍රමය .– මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයෙහි ආකෘතියට අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් සැකසූ අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කොට 2005.05.27 වැනි දිනට පෙරාතුව පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය. ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ ඔබ ඉල්ලුම් කරන තනතුර සඳහා බඳවා ගැනීම යනුවෙන් සටහන් කරන්න. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, තැපැලේ දී සිදුවන ප්‍රමාදයන් පිළිබඳව වගකියනු නොලැබේ.

සුදුසුකම් ලබා ඇති තනතුරට අදාළව අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ තනතුරු නාමය සඳහන් කිරීමට කටයුතු කරන්න.

ආනයන හා අපනයන පාලක.

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 01.

ආදර්ශ අයදුම්පත්‍රය

.....

තනතුරු නාමය සඳහන් කරන්න
ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

01. 01.1 මුල්කුරු සමඟ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) Mr./Miss/Mrs,

01.2 මුල්කුරු සමඟ නම :————. මයා/මිය/මෙනවිය,
01.3 මුල්කුරු වලින් කියවෙන නම් : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

02. 02.1 ස්ථිර පදිංචි ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

03. උපන් දිනය :————.
2005.05.27 වැනි දිනට වයස :
අවුරුදු :————, මාස :————, දින :————.
04. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
05. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිරත වූවෙකු නම්:
05.1 තනතුරේ නම :————.
05.2 ශ්‍රේණිය හා පංතිය :————.
05.3 සේවය ස්ථිර කර තිබේ ද ?:————.
05.4 අමාත්‍යාංශය :————.
05.5 දෙපාර්තමේන්තුව :————.
06. අධ්‍යාපන සුදුසුකම් :

06.1 උපාධියේ නම :————.
පන්තිය :————.
උපාධිය ලබාගත් ආයතනය :————.
වර්ෂය :————.

07. වෙනත් වෘත්තීය/ප්‍රහුණු සුදුසුකම් :
1. :————.
2. :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. මෙහි වූ කිසියම් තොරතුරක් අසත්‍ය හෝ සාවද්‍ය වුවහොත්, ඉහත තනතුර සඳහා කිසි ලෙසකින්වත් සුදුසුකම් නොලබන බව ද මම දනිමි. එසේම සේවයට බඳවා ගනු ලැබුව ද, මෙහි වූ කිසියම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව සනාථ වුවහොත්, කිසිදු විමසීමකින් තොරව හා වන්දි ගෙවීමකින් තොරව වහාම සේවයෙන් පහකල හැකි බව මා හොඳාකාරවම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

ඉහත නිලධාරියා/නිලධාරිනිය විසින් සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය ..... වැනි දින සිට ..... තනතුරේ මෙම අමාත්‍යාංශයෙහි /දෙපාර්තමේන්තුවෙහි / ආයතනයෙහි සේවය කරන බවට සහතික කරනු ලබන අතර, ඔහු/ඇය පසුගිය වසර තුන ඇතුළත අවවාද කිරීම් හැර කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොමැති බවත්, එසේ කිරීමට අදහස් කර නොමැති බවත්, මෙම තනතුරට තෝරාගනු ලැබුවහොත්, ඔහු/ඇය දැනට දරන තනතුරෙන් මුදාහරිය හැකි බවත් දන්වමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :————.

05-247

පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය

පරිසර කළමනාකරණ නිලධාරී (II ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීම

2005.04.21 දින හා අංක 1390 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද යටෝක්ත දැන්වීම් සම්බන්ධයෙනි.

ආදර්ශ අයදුම්පත්‍රයේ මාතෘකාව පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

"පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශයේ පරිසර කළමනාකරණ නිලධාරී (II ශ්‍රේණිය) තනතුර සඳහා අයදුම්පත්‍රය."

පී. එම්. ලීලාරත්න,
ලේකම්,
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය.

2005 අප්‍රේල් මස 28 වැනි දින,
05-262

අධිකරණ සේවා කොමිෂන් සභාව

ශ්‍රී ලංකා අධිකරණ සේවයේ පුරප්පාඩු

ශ්‍රී ලංකා අධිකරණ සේවයේ II පන්තියේ I ශ්‍රේණියේ නිලධාරී (මහෙස්ත්‍රාත්) තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අවශ්‍ය සුදුසුකම් ඇති තැනැත්තන් විසින් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි අයදුම්පත් මගින් ඉල්ලුම් කළ යුතු අතර, ඒවා 2005 ජූනි මස 30 දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය.

සටහන :

1. අයදුම්පත් තැපැල් මගින් හෝ පෞද්ගලිකව පැමිණ හෝ "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව, කොළඹ 12" නමින් රු. 500ක මුදල් ඇණවුමක් පමණක් ඉදිරිපත් කර ලබා ගත හැක.
2. අයදුම්පත් මෙම කාර්යාලය වෙත නිසි පරිදි ලැබීම සඳහා, පෞද්ගලිකව පැමිණ හෝ ලේඛනගත තැපෑලෙන් හෝ ඒවා ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන් වෙත උපදෙස් දෙනු ලැබේ.

03. *වැටුප් ක්‍රමය.*– රු. 2,38,920-7×8,580-රු. 2,98,980 ක වාර්ෂික වැටුප් පරිමාණයක් මෙම තනතුරට අයත්ය. (මේ අනුව සියලු දීමනා ඇතුළුව මූලික මාසික පඩිනඩි රජය විසින් ඒ ඒ අවස්ථාවල කරනු ලැබිය හැකි සංශෝධනයන්ට යටත්ව රු. 45,000 කට ආසන්න වේ.)

04. *සෑම අයදුම්කරුවෙක්ම :*
(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු අතර,
(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

05. *සුදුසුකම් :*
(අ) අවුරුදු දෙකකට නොඅඩු සේවා කාලසීමාවක් ඇති කම්කරු විනිශ්චයාධිකාර සභාපතිවරයෙකු වීම ; හෝ
(ආ) අවුරුදු තුනකට නොඅඩු කාලයක් ක්‍රියාකාරී වෘත්තියෙහි යෙදී සිටින හෝ යෙදී සිටි නීතිඥවරයෙකු වීම ; හෝ
(ඇ) යම් අමාත්‍යාංශයක හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක අවුරුදු තුනකට නොඅඩු කාලයක් නීතිමය තත්වයක සේවය කර ඇති නීතිඥවරයෙකු වීම ; හෝ
(ඈ) සමාගමක හෝ බැංකුවක හෝ වෙනත් ආයතනයක නීතිමය තත්වයක අවුරුදු තුනකට නොඅඩු කාලයක් සේවය කර ඇති හා එම කාලය තුළ නිරතුරුවම අධිකරණ ඉදිරියේ පෙනී සිටි නීතිඥවරයෙකු වීම.

06. පහත සඳහන් ලිපිලේඛන වලින් එකක් හෝ සියල්ලම ඉල්ලා සිටි විට ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට හැකිවිය යුතුය.
(අ) උප්පැන්න සහතිකය,
(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය,
(ඇ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය හා,
(ඈ) සිංහලෙන් හෝ දෙමළෙන් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

07. රජයේ සේවයේ නියුක්තව සිටින නිලධරයන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

08. අයදුම්පත් සහ ඊට අදාළ වෙනත් ලිපි ගණුදෙනු පිළිබඳව ඇමතිය යුත්තේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා මිස, මෙම කාර්යාලයේ වෙනත් කිසිදු නිලධරයකු නොවේ.

09. අයදුම්පත් ලැබුණු බැව් දැනුම් දෙනු ලැබේ. අයදුම්පත් එවීමෙන් මසක් ඇතුළත එය ලැබුණු බවට දැන්වීමක් නොලැබුණහොත්, ඒ බව අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත දැනුම් දිය යුතුය.

පී. ඩබ්ලිව්. ඩී. සී. ජයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

2005 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දී ය.
05-269

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2005 මැයි මස 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2005 මැයි මස 06 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

2005 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ලක්ෂමන් ගුණවර්ධන
වැඩ බලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

රජයේ මුද්‍රණාලයාධිපති විසින් ප්‍රකාශ කරන ලදී.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු ඇබෑර්තු

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුරු ඇබෑර්තු පුරප්පාඩු පිරවීම සඳහා අදාළ සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. සියළුම අයදුම්පත් මෙයට යාකර ඇති අදර්ශ ආකෘතිය අනුව සකස් කර අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, අංක 36, මලලසේකර මාවත, කොළඹ 07 යන ලිපිනයට 2005.06.03 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

01. *වැටුප් ක්‍රමය* :
   01.1මෙම තනතුර සඳහා වාර්ෂික ඒකබද්ධ වැටුප් ක්‍රමය -TB 12-10-රු.1,95,300-4x3,780 - 2x5,760 - 1x7,740 - 3x8,580-රු. 255,420 (රා.පරි. ව. 09/2004 අනුව වැටුප් ගෙවනු ලැබේ.)
02. *සුදුසුකම්* :
   02.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය,
   02.2 2005.06.03 දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය,
   (දැනටමත් රාජ්‍ය සේවයේ/පලාත් රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයට උපරිම වයස් සීමාව බල නොපානු ඇත,
   02.3 අවුරුදු 02කට නොඅඩු පළපුරුද්දක් ඇති ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු විය යුතුය.
03. *බඳවා ගැනීමේ ක්‍රමය* :
   03.1 විධිමත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සුදුස්සන් තෝරා ගනු ලැබේ.
   03.2 මෙම පත්වීම් කෙරෙනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගිනි.
04. *සේවා කොන්දේසි* :
   04.1 සියළුම තනතුරු ස්ථිර හා දායක විශ්‍රාම වැටුප් අරමුදල යටතේ දායක විශ්‍රාම වැටුකට හිමිකම් ඇත. පත්වීම් දින සිට මාසික ඉපයීම් වලින් සියයට අටක් දායක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතුය.
05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :
   05.1 ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි වල විධිවිධාන වලට ද කොමිෂන් සභා නියෝග වලට ද රජය විසින් වරින් වර නිකුත්කරනු ලබන වෙනත් රෙගුලාසි වලට හා නියෝග වලට ද අනුකූලව ක්‍රියා කළ යුතුය.
06. දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත අයගේ අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය.
07. දැනුම් දීමක් කළ විට අයදුම්කරුවන් පහත සඳහන් ලියවිලි ඉදිරිපත් කළ යුතුය.
   (i) අධ්‍යාපන සහතික,
   (ii) උප්පැන්න සහතිකය,
   (iii) ජාතික හැඳුනුම්පත්‍රය,
   (iv) පළපුරුද්ද පිළිබඳ සහතික,
   (v) චරිත සහතික දෙකක් (මින් එකක් ග්‍රාම නිලධාරියාගෙන් ලබාගෙන ප්‍රාදේශීය ලේකම් ලවා අනු අත්සන් කරවා ගත යුතුය.).
08. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. මෙම දැන්වීමේ අවශ්‍යතාවන්ට සෑම අතින්ම අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

පියසේන රණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව.

2005 අප්‍රේල් මස 28 වැනි දින,
කොළඹ 07,
අංක 36, මලලසේකර මාවත,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම් පත්‍රය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර සඳහා අයදුම්පත්‍රය

1. (i) සම්පූර්ණ නම :————. මහතා/මිය/මෙනවිය.
   (ii) මුල්කුරු සමග නම :————.
2. ලිපිනය :————.
   (i) පුද්ගලික ලිපිනය :————.
   (ii) රාජකාරී ලිපිනය :————. (රාජ්‍ය සේවයේ නියුක්ත නම්)
3. උපන් දිනය :
   අවුරුද්ද :————, මාසය :————. දිනය :————.
   2005.06.03 දිනට වයස : අවුරුදු :——, මාස.:——, දින :——.
4. ජන වර්ගය :————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
6. (i) අධ්‍යාපන සුදුසුකම් :————.
   (ii) වෘත්තීය සුදුසුකම් :————.
7. පළපුරුද්ද :————.
8. රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූ හෝ ධුරය හැරගිය අයෙකු ලෙස සලකනු ලැබූ කෙනෙක් ද යන වග :————.
9. කිසියම් වරදකට උසාවියෙන් දඩුවම් ලබා තිබේ ද ?:————.

මෙම අයදුම් පත්‍රයේ මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත් මා නුසුදුස්සෙකු වීමට හේතු වන බවත්, පත් කිරීමෙන් පසුව දැන ගතහොත් ඊට කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නම් :

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

.....මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.
නම :————.
තනතුර :————.
දෙපාර්තමේන්තුව :————.
(නිල මුද්‍රාව සහිතව)

05-281

විභාග, විභාග ප්‍රතිඵල ආදිය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
2005 වසර සඳහා පාඨමාලා
(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතින් සංස්ථාපනය කරන ලදී)
තොරතුරු සහ මාධ්‍ය අමාත්‍යාංශය මාතලේ සහ බේරුවල ශාඛා

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, බේරුවල කොළඹ ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පිහිටුවා ඇති ශාඛාවන් මගින් පහත සඳහන් පාඨමාලා මැයි/ජූනි මාසවල ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

අද පවතින රැකියා ඉල්ලුමට සරිලන පරිදි කාර්යාල මෘදුකාංග, පරිගණක අකුරු ඇමිණීම, පරිගණක මුද්‍රණ රටා, ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය, ගණකාධිකරණය යන විෂයයන් අලලා මෙම පාඨමාලා සකස්කොට ඇති අතර, සාධාරණ මිලකට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මාතලේ හා බේරුවල ශාඛාවන් තුළින් හඳුන්වා දෙයි.

(01) පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ කාර්යාල මෘදුකාංග පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව,
(Certificate Course in Computer Typsetting and desk Top Publishing)
ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුල්වීමට බලාපොරොත්තු වන නවකයන් සඳහා විශේෂයෙන් සැකසුනු පාඨමාලාවකි. පරිගණක දැනුමක්, මූල සිටම පරිගණක භාවිතය සහ මෘදුකාංග අධ්‍යයනය (Computer and Software applications) පිළිබඳ මනා දැනුමක් හා සිත්තම් නිර්මාණය පිළිබඳ මූලික අවබෝධයක් ද ලබා දෙන අතර මෙම පාඨමාලාව ග්‍රැෆික්ස් පාඨමාලාව හැදෑරීමට අවශ්‍ය පූර්ණ දැනුමක් (Certificate Course in Graphic Designig හා අවබෝධයක් ලබාදෙයි. *පාඨමාලා කාලය-මාස 05 මාධ්‍යය-සිංහල/ඉංග්‍රීසි.*
ගාස්තු-රු. 7,000. දින - සතිපතා සහ සති අන්ත කණ්ඩායම් කීපයක් පැවැත් වේ.

(02) පරිගණක ආශ්‍රිත රූ රටා නිර්මාණකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව :
(Certificate Course in Computer Graphic Designig)
පරිගණක ආශ්‍රිත නිර්මාණකරනයට උනන්දුවක් දක්වන නවකයන්ටත් ග්‍රැෆික්ස් ප්‍රචාරක මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රවල නියලෙන පුද්ගලයන්ට මෙම පාඨමාලාව හඳුන්වා දෙයි.
පාඨමාලා කාලය-මාස 04 මාධ්‍යය-සිංහල/ඉංග්‍රීසි.
ගාස්තු-රු. 7,000 දින - සතිපතා සහ සති අන්ත පංති කීපයක් පැවැත් වේ.

(03) ගණකාධිකරණය පිළිබඳ පාඨමාලාව
(Certificate Course in Book Keeping and Accounts)
මෙම පාඨමාලාව තුළින් අද කාර්යාලවල එදිනෙදා ගිණුම් කටයුතු සාර්ථකව කර ගැනීමට අවශ්‍ය දැනුම වර්ධනය වන අයුරින් සකස් කොට ඇති අතර ඒ තුළින් ගණකාධිකරණය පිළිබඳ දැනගත යුතු මූලික සංකල්ප සහ න්‍යායාත්මක කරුණු පිළිබඳව පූර්ණ දැනුමක් ද ලබා දේ.
පාඨමාලා කාලය-මාස 04 මාධ්‍යය-සිංහල.
ගාස්තු-රු. 1,500 දින - සතිපතා සහ සති අන්ත පංති කීපයක් පැවැත් වේ.

(04) පාසැල් සිසුන් සඳහා පරිඝණක ශිල්පය හඳුන්වාදීමේ පාඨමාලාව :
(Introduction to Computers for School Children)
මෙම පාඨමාලාව පාසල් සිසුන්ට සරිලන සේ සකසා ඇති අතර ඔවුන්ට අවශ්‍ය මූලික පරිඝණක ආශ්‍රිත දැනුම සහ මෘදුකාංග භාවිතය පිළිබඳ දැනුම ලැබෙන අයුරින් සකසා ඇත.
පාඨමාලා කාලය-මාස 02 සති 2 යි මාධ්‍යය-සිංහල
ගාස්තු-රු. 1,000 දින - සතියට එක් දිනක් බැගින් සවස පංති

මාතලේ ශාඛාව

විමසීම් :
සමන්ත කුලතුංග
පාඨමාලා උපදේශක
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
මාතලේ ශාඛාව
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
මාතලේ.
දුරකථන අංක : 071-4895044.
0714-917700.

බේරුවල ශාඛාව

හරිත වැන්දබෝනා
පාඨමාලා උපදේශක
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
බේරුවල ශාඛාව
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
බේරුවල.
දුරකථන අංක : 034-2279881,

මෙම පාඨමාලාවලට බඳවා ගනු ලබන්නේ සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණක් නිසා හැකි ඉක්මණින් ආසන වෙන්කරවා ගන්න.

බේරුවල සහ මාතලේ ශාඛාවල හඳුන්වාදී ඇති පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ කාර්යාල මෘදුකාංග පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සහ පරිගණක ආශ්‍රිත රූරටා නිර්මාණකරණ පිළිබඳ සහති පත්‍ර පාඨමාලාවන් හැදෑරීමෙන් කොළඹ පිහිටි ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ප්‍රධාන ශාඛාව මගින් හඳුන්වා දී ඇති මුද්‍රණ, දෘෂ්‍ය සන්නිවේදන සහ කළමණාකරණ විෂයයන් ආශ්‍රිත උසස් ඩිප්ලෝමා පාඨමාලාවන්වලට ඇතුල්වීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ගත හැක.

ප්‍රධාන ශාඛාව :
ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,
අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.
දුරකථන අංකය : 2686162, 2679791.
ෆැක්ස් අංකය : 2686162.
e-mail : sliopdiv @-Sri. Lanka.net

05-226

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

බඩු බාහිරාදිය විකිණීම්

මාතලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම මාතලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් කිසිවෙකු හිමිකම් නොකියන ලද පහත සඳහන් ද්‍රව්‍යයන් 2005.06.19 වැනි දින පෙ. ව 9.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව කිසිවෙකු අයිතිවාසිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම ඉදිරිපත් කළ යුතුය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

වෙන්දේසියෙන් මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් එම වේලාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන ගැණුම්කරුවන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

දිසා විනිසුරු/මහේස්ත්‍රාත්,
මාතලේ.

2005 අප්‍රේල් මස 20 වැනි දින,
මාතලේ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

භාණ්ඩ වෙන්දේසිය - 2005

නඩු අංකය	*පී. ආර්. අංකය*	*භාණ්ඩ විස්තරය*
01. 52871	පී. ආර්. 2283/03	ලී මිට සහිත සවල් 01යි
02. 49604	පී. ආර්. 1296/03	ලී මිට සහිත සවල් 01යි
03. 49603	පී. ආර්. 1297/03	ලී මිට සහිත සවල් 01යි
04. 53246	පී. ආර්. 2467/03	ලී සහිත සවල් 01යි
05. 52875	පී. ආර්. 2282/03	ලී මිට සහිත සවල් 01යි
06. 52874	පී. ආර්. 2281/03	ලී මිට සහිත සවල් 01යි
07. 20163	පී. ආර්. 46/03 මිට සහිත උදලු 01යි	
08. 20405	පී. ආර්. 119/04	මිට සහිත උදලු 01යි
09. 20755	පී. ආර්. 131/04	මිට සහිත උදලු 01යි
10. 18913	පී. ආර්. 36/03 මිට සහිත උදලු 01යි ඉල්ලුම් කුරු 01යි	
11. 48025	පී. ආර්. 571/03	මිට සහිත උදලු 01යි
12. 20161	පී. ආර්. 44/03 මිට සහිත උදලු 01යි	
13. 61060	පී. ආර්. 1882/04	මිට සහිත උදලු 01යි
14. 20765	පී. ආර්. 121/04	යකඩ බාල්දි 01යි
15. 20162	පී. ආර්. 45/03 යකඩ බාල්දි 01යි	
16. 20763	පී. ආර්. 123/04	යකඩ බාල්දි 01යි
17. 20164	පී. ආර්. 47/03යකඩ බාල්දි 01යි	
18. 61141	පී. ආර්. 23/05 යකඩ බාල්දි 01යි	
19. 61140	පී. ආර්. 24/05 යකඩ බාල්දි 01යි	
20. 61059	පී. ආර්. 2881/04	යකඩ බාල්දි 01යි
21. 53256	පී. ආර්. 2468/03	යකඩ තාච්චු 01යි
22. 53245	පී. ආර්. 2466/03	යකඩ තාච්චු 01යි
23. 47849	-	ඉරුම් කියත් 01යි, ලී අඩි රූල් 01යි
24. 38985	-	ඉරුම් කියත් 01යි, පිහියා 01යි යකඩ ලඹ 01යි, ලී අඩි රූලි 01යි
25. 43031	-	ඉරුම් කියත් 01යි, ලඹ 01යි
26. 51063	-	ඉරුම් කියත් 01යි
27. 33487	පී. ආර්. 17/2000	සංඥා ලාම්පු කට්ටල 01යි ඉදිරිපස පැති කණ්නාඩි 02යි
28. 32928	පී. ආර්. 182/2000	ඉදිරිපස සංඥා ලාම්පු 02යි වම්පස පැති කණ්නාඩි 02යි
29. 31230	පී. ආර්. 03/2000	වම්පස පැති කණ්නාඩි 02යි ටොනික් වර්ගයේ කැසට් යන්ත්‍ර 01යි
30. 34470	පී. ආර්. 190/2000	පිටුපස සංඥා ලාම්පු 02යි, කැසට් යන්ත්‍ර 01යි
31. 34405	පී. ආර්. 189/2000	ඉදිරිපස සංඥා ලාම්පු හා ආවරණ 01යි, ඉදිරිපස සංඥා ලාම්පු 01යි, පිටුපස සංඥා ලාම්පු 01යි
32. 32156	පී. ආර්. 07/2000	ඉදිරිපස පැති කණ්නාඩි 01යි පිටුපස පැති කණ්නාඩි 01යි කැසට් යන්ත්‍ර 01යි
33. 31469	පී. ආර්. 04/2000	පිටු පස සංඥා ලාම්පු 02යි වම්පස පැති කණ්නාඩි 02යි පිටුපස වාමුවාකනණ්නාඩි 01යි ඉදිරිපස සංඥා ලාම්පු 02යි ඉදිරි ප්‍රධාන ලාම්පු 01යි වම්පස පැති කණ්නාඩි 02යි, ආම් 01යි, කැසට් රේඩියෝ 01යි, ස්පිකර් 01යි, පිටුපස වාමුවා කණ්නාඩි 01යි
34. ඒ. ආර්. 777/03	පී. ආර්. 2005/03	අංක ඕ. එම්. 9812863 දරන නිල් හා රතු පාට මවුන්ටන් වර්ගයේ පාපැදිය
35. ඒ. ආර්. 777/03	පී. ආර්. 2007/03	අංක ඒ. 2070035 දරන කොල පාට මවුන්ටන් වර්ගයේ පාපැදිය
36. ඒ. ආර්. 777/03	පී. ආර්. 2009/03	අංක සී. ජේ. 412926 දරන හන්ටර් වර්ගයේ හැඩලය සහිත හීරෝ රෝයල් යනුවෙන් සඳහන් ලැගේජය සහිත කලුපාට පාපැදිය
37. ඒ. ආර්. 777/03	පී. ආර්. 2010/03	අංක 10186 දරන මේඩින් ඉන්දියා යනුවෙන් සඳහන් පාපැදිය
38. ඒ. ආර්. 778/03	පී. ආර්. 2090/03	අංක වයි. එම්. 52484 දරන හීරෝ වර්ගයේ ලැගේජය සහිත පාපැදිය
39. ඒ. ආර්. 778/03	පී. ආර්. 2091/03	අංක යූ 756 යනුවෙන් සඳහන් ලැගේජය සහිත නිල්පාට හීරෝ වර්ගයේ පාපැදිය

නඩු අංකය	පී. ආර්. අංකය	භාණ්ඩ විස්තරය
40. ඒ. ආර්. 752/03	පී. ආර්. 559/03	ටොප්ඩ්‍රයිව් වර්ගයේ අංකය අපැහැදිලි පාපැදිය
41. 57668	-	රවුම් කියත සමග දැව ඉරුම් මෝල අමතර රවුම් කියත් 01යි, ලී මිට සහිතත පොරව
42. 56798	පී. ආර්. 1595/04	පුටු කට්ටලයක් සඳහා කළුවර ලීයෙන් සකස් කරන ලද පහත සඳහන් ගෘහ භාණ්ඩ කොටස් ඇදි වියනක හැඩ ඇති කැටයම් කපන ලද දිග අඩි 07 යි අහල් 02යි, උස අඩි 02යි, අහල් 09ක් වූ කැලි 01යි, ඉදිරිපස යටි ඇන්දක හැඩය ඇති කැටයම් කපන ලද දිග අඩි 06යි අහල් 01ක් වූ උස අඩි 01 ක් වූ කැලි 01යි,"යූ" හැඩය ඇති පොඩි පුටුවක ඉදිරිපස ඇඳි කැටයම් කපන ලද දිග අඩි 02යි අහල් 08ක් වූ කැලි 01යි, යූ හැඩ් කපන ලද දිග අඩි 02යි අහල් 08යි, කැලි 01යි, පොඩි පුටුවක ඉදිරිපස ඇඳි කැටයම් කපන ලද දිග අඩි 02යි අහල් 08යි, කැලි 01යි, ස්ටූල් එකේ යට කොටස දිග අඩි 02යි, අහල් 11යි, පළල අහල් 11යි කැලි 01යි, ලී පටි (හතරස්) දිග අඩි 02යි, අහල් 10යි, කැලි 01යි ලී පටි (හතරස්) දිග අඩි 01යි, අහල් 09යි, කැලි 07යි ලී පටි (හතරස්) අඩි 01යි, අහල් 08යි, කැලි 06යි
43. 61203	පී. ආර්. 05/05	රෙගියුලේටරය සමග ගෑස් ලිප
44. 20382	-	අංක 27 ශ්‍රී 5053 දරන ඉසුසු වර්ගයේ ලොරිය
45. නඩු අංක නැත	-	හිස් බැරල් තොගයක්
46. නඩු අංක නැත	-	හිස් බෝතල් තොගයක්
47. නඩු අංක නැත	-	හිස් බූලි තොගයක්
48. නඩු අංක නැත	-	වේවැල් කූඩා තොගයක්
49. නඩු අංක නැත	-	විනිසුරු නිල රථයේ ගෙවී ගිය ටයර් 06යි
50. නඩු අංක නැත	-	යකඩ සුන්බුන් තොගයක්

05-278

පොලිස් දෙපාර්තමේන්තුව

පොලිස් කොට්ඨාසය - කන්තලේ

පොලිස් දෙපාර්තමේන්තුවට අයත් කන්තලේ පොලිස් කොට්ඨාශයේ, දිසා ගබඩාවේ තැන්පත් කර ඇති ප්‍රයෝජනයට ගත නොහැකි පහත සඳහන් භාණ්ඩ 2005.05.21 වැනි දින පැය 10.00 ට කන්තලේ පොලිස් ස්ථාන භූමියේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මීලයට ගනු ලබන භාණ්ඩ සඳහා එම අවස්ථාවේදීම මුදල් ගෙවා ලදුපත් ලබාගත යුතු අතර, එම භාණ්ඩ වෙන්දේසිය පැවැත්වෙන දින, පැය 16.00 ට පෙර වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

02. ගැනුම්කරුවන්ට අවශ්‍ය නම් වෙන්දේසියට පෙර දින එනම් 2005.05.20 දින පැය 9.00 සිට 13.00 දක්වා කන්තලේ පොලිස් ස්ථානයට පැමිණ ගබඩාවේ නිලධාරීන් හමුවී භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

03. මෙම වෙන්දේසිය පිළිබඳ කන්තලේ කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා විසින් ගනු ලබන තීරණ අවසාන තීරණයන් බව සලකන්න.

ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
කන්තලේ කොට්ඨාසය.

අබලි භාණ්ඩ පිළිබඳ වාර්තාව

01.	කැරම් බෝඩ්	05
02.	පොරොව තල	02
03.	නිරමනා	07
04.	වතුර පිල්ටර්	07
05.	උදලු තල	35
06.	වතුර බොයිලේරු	05
07.	විසිකැති	46
08.	විල්බැරෝ	01
09.	ටියුබ්ලයිට් සෙට්	195
10.	තනි ඇඳන්	15
11.	යුගල ඇඳන්	08
12.	හැලජන් ලාම්පු සෙට්	40
13.	සිංහල යතුරුලියන	02
14.	රථවාහන සුදු හෙල්මට්	01
15.	තාව්වි	05
16.	කුෂන් කරන ලද සාමාන්‍ය පුටු	59
17.	වතුර මොටර් අහල් 1 1/2	01
18.	කැති තල	10
19.	ගිණි නිවන උපකරණ	02
20.	පාපැදි	21
21.	රෝනියෝ යන්ත්‍ර	01
22.	ඇඳුම් පෙට්ටි	03
23.	වතුර ටැන්කි ප්ලාස්ටික්	07
24.	බාල්දි (ලොකු, කුඩා, මධ්‍යම)	45
25.	සිවිලිං විදුලි පංකා	02
26.	කල්දේරම් (අහල් 12, 16, 24, 30)	85
27.	කැසට් රේඩියෝ	02
28.	රේඩියෝ	01
29.	අහල් 21 රූපවාහිනී	02
30.	අහල් 14 රූපවාහිනී	01

05-224

තොටුපල රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

හලාවත ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාසය

රා තැබෑරුම් රේන්දය 2005/2006 වර්ෂය

2005 ජූලි මස 01 වැනි දින සිට 2006 ජූනි මස 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර්යක්ම ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර. පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කල බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩර්යේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් 15% වටිනාකමට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩර්යක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි "අංක ..... දරන .....රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2005.05.19 වැනි දින පෙරවරු 10.00 ට පෙර හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. *නැනහොත්* එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ කරන ලද අංක 207 *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසි වලට අනුකූල විය යුතුයි.

05. 2005.05.19 වැනි දින පෙරවරු 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කල වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පෙනී සිටිය හැකිය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වන රා තැබෑරුම් නැවත විකිණීම 2005.06.07 වැනි දින පෙරවරු 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතායන්ට අනුකූලව විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය. (දුරකතන අංකය 032-23205)

එම්. සී. ප්‍රනාන්දු, *(වැඩබලන)*
ප්‍රාදේශීය ලේකම්/හලාවත.

2005 අප්‍රේල් මස 26 වැනි දින,
හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

අනු අංකය	කොට්ඨාසය	ග්‍රාමීය නැබෑරුම	ටෙන්ඩර් භාරගන්නා දිනය හා වේලාව	ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල්
01.	හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 02 දරන කොට්ඨාසය	ඉඩම්පිටිය	2005.5.19 පෙ. ව. 10.00	2,000
02.	හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 03 දරන කොට්ඨාසය	අළුත්වත්ත	2005.05.19 පෙ. ව. 10.00	1,000
03.	උතුරු පිටිගල් කෝරළය	ඔළිදළුව	2005.05.19 පෙ. ව. 10.00	250

05-223

පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

රා තැබෑරුම් රේන්ද විකිණීම/2005-2006 වර්ෂය

2005 ජූලි මස 01 දින සිට 2006 ජූනි 30 දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි සහ සෑම සුරාබදු බලපත්‍රයක් ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩර් පත්‍රයක් ම පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයෙන් සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සිය හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සැලසුම් කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරේ "අංක ..... දරන ..... රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය "යනුවෙන් සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2005.05.17 දින පෙ. ව. 10.00 ට පෙර පුත්තලම ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. *නැනහොත්* එම වේලාවට පෙර පුත්තලම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුලත් විය යුතුය.

05. 2005.05.17 දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර් කරුවන් පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඒ. සී. එම්. නසීල්,
ප්‍රාදේශීය ලේකම්/ පුත්තලම.

2005 අප්‍රේල් මස 25 වැනි දින.

අනුක්‍රමික අංකය	කොට්ඨාසය	ග්‍රාමය	උපලේඛනය: තැබෑරුම් විවෘත කරන වේලාව	තැබෑරුම් වසන වේලාව	ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව	ටෙන්ඩර් තැන්පත් මුදල
01.	පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	සේනකුඩිරිප්පුව	පෙ. ව. 11.00 ප. ව. 5.00	ප. ව. 2.00 රාත්‍රී 8.00	2005.05.17 පෙ. ව. 10.00	රු. 1,000

05-254

ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාසය

රා තැබෑරුම් රේන්ද විකිණීම-2005/2006 වර්ෂය

2005 ජූලි 01 දින සිට 2005 ජූනි මස 30 දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරා බදු බලපත්‍රයක්ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කල බවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක්ද ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි "අංක .....රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2005.05.20 වැනි දින පෙ. ව. 10.00 ට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. *නැනහොත්* එම වේලාවට පෙර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම සඳහා 1982.08.20 දින පළවී ඇති අංක 207 *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසි වලට අනුකූල විය යුතුය.

05. 2005.05.20 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කල වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය. පූර්වෝක්ත දින විකිණීමට නොහැකිවූ තැබෑරුම් සඳහා නැවත විකිණීම 2005.06.08 දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම යථෝක්ත *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

06. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එම්. සී. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,

ආරච්චිකට්ටුව.
2005 අප්‍රේල් මස 28 වැනි දින.

උපලේඛනය

කොට්ඨාසය	ග්‍රාමය	තැබෑරුම් අංකය	ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව	ටෙන්ඩර් තැන්පත් මුදල රු.
ආනවිලුන්දන්	කරුකුපනේ	10	2005.05.20	250 0
ආනවිලුන්දන්	ආරච්චිකට්ටුව	11	පෙ. ව. 10. 00 ට	250 0
ආනවිලුන්දන්	බත්තුලුඔය	12		250 0

05-259

මාඳම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

රා තැබෑරුම් රේන්ද විකිණීම-2005/2006 වර්ෂය

2005 ජූලි 01 දින සිට 2006 ජූනි 30 වෙනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා1982 අගෝස්තු 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසිය හා සෑම සුරා බදු බලපත්‍රයක්ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාර ගනුලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි, නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කලබවට ලබා ගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණය යටත් පිරිසෙයින් 15%කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද, ඇමිණිය යුතුයි.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙලවරෙහි "අංක 13 දරන පම්බල රා තැබෑරුම" සඳහා ටෙන්ඩර් පත්‍රය චෙනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි රා තැබෑරුමේ නම හා අංකය සඳහන් කොට 2005 මැයි 25 වැනි දින පෙ.ව. 10.00ට පෙර මාඳම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහා ලිය යුතුයි.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළවී ඇති අංක 207 *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසි වලට අනුකූල විය යුතුයි.

05. 2005 මැයි 25 දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මාඳම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2005.06.11 වැනි දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අදාළ විය යුතුයි.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

කොට්ඨාසය	ග්‍රාමය	තැබෑරුම් අංකය	උපලේඛනය ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව	ටෙන්ඩර් නැන්පත් මුදල රු. ශත
වික්‍රම වරාගොඩ, ප්‍රාදේශීය ලේකම්, මාදම්පේ.	උතුරු පිටිගල් 05-258	පම්බල	13	2005.05.25 පෙ.ව. 10.00	රු. 1,000

ආණ්ඩුවේ නොවන දැන්වීම්

ඇටෝනි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බක්තරමුල්ල, අකුරේගොඩ, මෛත්‍රී ධර්මායතන මාවත, අංක 529/2 හි පදිංචිව සිටි, දැනට ඕස්ට්‍රේලියාවේ අංක 1/8 ඒ මාර්ස්ඩන් රෝඩ්, වෙස්ට් රයිඩ් එන් එස් ඩබ්ලිව් 2114 හි පදිංචි සංජීව අලහකෝන් වන මම, විසින් අත්සන් කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් කේ. ටී. පියදාස විසින් වර්ෂ 2003 ක් වූ අප්‍රේල් මස 22 වැනි දින සහතික කරන ලද අංක 1459 දරන ඇටර්නි බලපත්‍රයට අනුව, මහරගම, මංගල මාවතේ, අංක 435 හි පදිංචි අජිත් අලහකෝන් වෙත බලය පවරන ලද එකී ඇටර්නි බලපත්‍රය අවලංගු කර, ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද බව ද, අද පටන් ඔහු විසින් එකී ඇටර්නි බලපත්‍රය යටතේ කරනු ලබන කිසිදු ගනුදෙනුවකට මා වග නොකියන බව ද, මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

සංජීව අලහකෝන්.

05 – 240

අංක 1841 දරන විශේෂ ඇටෝනි බලපත්‍රය අවලංගු කිරීම

බේරුවල පන්සල පාරේ අංක 28 පදිංචි පෙට්ටගත් ලාල් අජන්ත ද සිල්වා වන මා විසින් කළුතර නාගොඩ ගංඉම කුරුඵවත්ත 'ගයාන්' හි පදිංචි පෙට්ටගම් ගාෂාමෙන් ඉන්දිකා ද සිල්වා යන අයට පවරන ලද සිරි ආ පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් සහතික කර අංක 1841 දරන 2004.08.06 විශේෂ ඇටර්නි බලපත්‍රය අද දින 2005.04.26 සිට අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

පෙට්ටගත් ලාල් අජන්ත ද සිල්වා.

05-246

ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

හක්මන, මුරුතාමුරය, හක්මණවත්ත, විජය මාවත, අංක 265/2 හි, ප්‍රියාණී මුණසිංහ වන මා විසින්, හක්මණ, මුරුතාමුරය, විජය මාවත, අංක 265/2, හි ලංගප්පුලිගේ අනෝමා මල්කාන්ති යන අය හට දෙන ලද මාතර ප්‍රසිද්ධ නොතාරිස් ගීතා පී. කුමාරප්පෙරුම මහත්මිය විසින් සහතික කරන ලද 1998 නොවැම්බර් 18 දිනැති අංක 70 දරන ඇටර්නි බලපත්‍රය අවලංගු කොට අහෝසි කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

වර්ෂ 2005 ක් වූ, මැයි මස 13 දින සිට එකී ඇටර්නි බලපත්‍රය අවලංගු වන අතර, එකී ලංගප්පුලිගේ අනෝමා මල්කාන්ති මාගේ ඇටර්නි බලකරු වශයෙන් ක්‍රියා කිරීමද අවසන් වේ.

මින් පසුව එකී ලංගප්පුලිගේ අනෝමා මල්කාන්ති විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු කටයුත්තක් සම්බන්ධයෙන් මා කිසිදු ආකාරයකින් හෝ වග නොකියන බවද නවදුරටත් දැනුම් දෙමි.

ප්‍රියානී මුණසිංහ.

2005 ක් වූ මැයි මස 13 වැනි දින දී ය.

05 – 235

ඇටෝනි බලපත්‍රය අවලංගු කිරීම

රංජිත් නාරංගොඩගේ රොඩ්නි මොනිස්ටර් බැස්ටියන් යන මම 2004.07.08 වැනි දින කුරුණෑගල රෙජිස්ට්‍රාර් ජෙනරල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද රංජිත් නාරංගොඩගේ ගාමිනී ජයලත්ට (හැ. අංකය 642012398V) දී තිබූ ඇටෝනි බලපත්‍රය අද දින සිට අවලංගු කරන අතර ඒ සම්බන්ධ කිසිදු ගණුදෙනුවකට මින් පසු මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

05-301/1

ඇටෝනි බලපත්‍රය අවලංගු කිරීම

රංජිත් නාරංගොඩගේ ගාමිනී සිල්වෙස්ටර් බැස්ටියන් වන මම 2004.09.06 වැනි දින කුරුණෑගල දී ලියාපදිංචි කරන ලද ආර්. ශ්‍රීපාලි චන්ද්‍රිකාට දී තිබූ අංක 9900 දරන ඇටෝනි බලපත්‍රය අද දින සිට අවලංගු කරන අතර ඒ සම්බන්ධ කිසිදු ගණුදෙනුවකට මින් පසු මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

05-301/2

වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

සීමාසහිත සෙලාන් බැංකුව- පානදුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

පදිංචියට සුදුසු ඉතා අගනා දේපළ

පානදුර නගර සභා සීමාව තුල වලාන ගමේ විද්‍යාල පාරේ පදිංචි පිහිටි 'අඹගහවත්ත' නැමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුල පිහිටි ගහකොළ ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය පර්චස් 11 යි.

මෙම දේපල පානදුර 'මල්ටිපැබ් ඉන්ජිනියර්ස්' යන නාමය යටතේ දෙදෙනාම හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන සෙල්ලප්පෙරුමගේ ඩෙන්සිල් එඩිමන්ඩ් ප්‍රනාන්දු අමරසේකර සහ විදානලාගේ සමන්ති ද මෙල් හෙවන් සෙල්ලප්පෙරුමගේ සමන්ති ප්‍රනාන්දු අමරසේකර යන අය බන්ධනාදායීන් වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත. 2005 ක් වූ ජුනි මස 08 වන දින පෙ. ව. 11.30ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2004.08.06 දින *රජයේ ගැසට් පත්‍රය* 2004.07.29 දින 'දිනමිණ' 'ඩේලිනිවිස්', හා 'තිනකරන්' පුවත්පත් බලන්න.

ඉඩමට පිවිසීම.– ගාලු පාරේ පානදුර නව පාලම පසුකල විට හමුවන වටරවුමෙන් වමට ඇති පරන මොරටුව පානදුර පාරට හැරී කෙටිදුරක් ගමන්කර දකුණු දෙසට ඇති ශ්‍රී විජය පාරේන් වලාන පාරට පිවිස වමට හැරී විගසම දකුණට ඇති විද්‍යාල පාරට පිවිස මීටර 30 පමණ ගමන්කල විට දකුණු දෙසින් හමුවන බොරළු පාර මෙම දෙපලට දිවේ.

ගෙවීමේ ක්‍රමය.– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරුට වෙන මුදලින් ගෙවිය යුතුය.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්) ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි). වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකරු හා සෝෂක චේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී සීමාසහිත සෙලාන් බැංකුවට ගෙවා නිම කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (නීති) සීමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90 ගාලු පාර, කොළඹ 03.

දුරකථන : 011 – 4701275, 011 – 2456258, 077 – 7736452

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 432/1, මවුන්ට් ප්ලසන්ට් ගාර්ඩන්ස්,
බෝවලවත්ත පාර, හිරිස්සගල
මහනුවර.

දුරකථනය : 081 –2217768, 071 – 4755974, 071 – 2755974
ෆැක්ස් -081–2217768

05-264/2

සීමාසහිත සෙලාන් බැංකුව- නාවල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

නුගේගොඩ පාගොඩ පාරේ පදිංචියට සුදුසු අගනා දේපළ

බෙදා වෙන්කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ ඉඩම එහි පිහිටි ගොඩනැගිල්ල ගහකොළ වගාවන් හා සෑම සියලු දේ සමඟය. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලෙපෙත්තුවේ, කෝට්ටේ නගර සභා සීමාව ඇතුළත පාගොඩ පිහිටි වැපල් පාරේ, වරිපනම් අංක 35 දරන, කහටගහලන්ද වත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජී. ඒ. එච්. පිලිපයියා විසින් මැන සාදන ලද 1987.01.15 දාතම හා අංක 4904 දරන පිඹුරේ ලොට් සී 1 වශයෙන් නිරූපිත අගනා දේපල (ප්‍රමාණයෙන් පර්චස් 15.50 ක ඉඩම) සමග කෝට්ටේ නගර සභා සීමාවක ඇතුළත, පාගොඩ පිහිටි කහටගහලන්දවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. ඩබ්ලිව්. පෙරේරා විසින් මැන සාදන ලද 1955.10.16 දාතම හා අංක 1050 දරන පිඹුරේ ලොට් බී වශයෙන් නිරූපිත (මාර්ගය සඳහා වෙන් කෙට ඇති භූමිය)බිම් කොටස මෙහින් අතරින් තුළින් මාර්ග අයිතිය ද හා සමඟය. (ප්‍රමාණයෙන් පර්චස් 3.82 ක ඉඩම) සීමාසහිත සෙලාන් බැංකුව විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත කී දේපල මවිසින් 2005 ජුනි 07 වැනිදා අභාරුවාදා පෙ. ව 10.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

(නෙස්ට් මාකටින් යන ව්‍යාපාරික ව්‍යාපාර නාමය යටතේ නුගේගොඩ ව්‍යාපාරික කටයුතු කරගෙන යන තරණී දක්ෂිණ ගුණවර්ධන සහ ධම්මික නිශ්ශංක ගුණවර්ධන යන අය බැදුම්කරුවන් වශයෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. එල්. එච්. එච්. සිල්වා විසින් ලියා සහතික කළ 1996.12.04 දාතම හා අංක 131 සහ 1998.01.05 දාතම හා අංක 737 දරන බැදුම්කර මත බැංකුවට අය විය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයිනි)

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2002.08.23 දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2002.08.08 දින 'ඩේලිනිවිස්', 'දිනමිණ' හා 'තිනකරන්' පුවත්පත්ද සහ විකුණුම් නිවේදනය සඳහා 2005.05.13 දින *රජයේ ගැසට් පත්‍රයද* බලන්න.

ගෙවීමේ ක්‍රමය :

1. ගැනුම් මිලෙන් 10% ක් මිල තීන්දු වූ වහාම ගෙවිය යුතුය,
2. ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට වැඩ කරන දින 30 ක් ඇතුළත,
3. පළාත් අධිකාරියට ගෙවිය යුතු දේශීය විකුණුම් බද්ද ;1% ක (සියයට එකක)
4. විකුණුම් මිලෙන් 2 ½% ක (සියයට දෙකහමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
5. රු. 32,707 නොඉක්මවන සම්පූර්ණ ප්‍රචාරක වියදම්න් 50% ක්,
6. ලිපිකරුගේ ගෝෂකගේ ගාස්තුව රු. 500,
7. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2500.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාළ ලිපිලේඛන කොළඹ 3, ගාලු පාරේ අංක 90, "සෙලින්කෝ සෙලාන් ටවර්ස් " හි 12 වන මහලේ සීමාසහිත සෙලාන් බැංකුවේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (නීති දෙපාර්තමේන්තුව) වෙතින් ලබාගැනීම හා පිරික්සීම කළ හැකිය. දුරකථන : 074-701000/2456789.

ඩන්ස්ටන් කෙලාට්,
උසාවි කොමසාරිස් සහ බ්‍රෝකර්,
විශේෂඥ වෙන්දේසිකරු, තක්සේරුකරු,
සහ දේපල නියෝජිත.

අංක 381 - 1/1,
ගාලු පාර,
කොළඹ 04.

දුරකථනය : 2591167, දුරකථන/ෆැක්ස් : 2584874/2500838.
ක්ෂණික ඇමතුම් : 0722-250422.

05-275

සීමාසහිත සෙලාන් බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

ඉතා වටිනා අංග සම්පූර්ණ කර්මාන්ත ශාලාවක්

රත්නපුර – බදුල්ල මහාමාර්ගට මායිම්ව හල්දමුල්ල, වෙලේගම ගමේ පිහිටි "මහකළුපහන තැන්න" නමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එම ඉඩමේ පිහිටි (Pines Oleo Rasin Project) කර්මාන්ත ශාලාවට අයත් සියලු ගොඩනැගිලි යන්ත්‍රෝපකරණ හා එකී ගොඩනැගිලි වලට හා භූමියට ස්ථිරව තද කොට සවිකර ඇති යන්ත්‍ර සූත්‍ර ඇතුළු අනෙකුත් සියලු දේ ඉඩමේ ප්‍රමාණය – අක්කර 03, රූඩ් 02, පර්චස් 25යි.

අයිතමය	*ප්‍රමාණය*
01. උණු කරන ටැංකි මල නොබැඳෙන වානේ	01
02. එකිනෙකට අතුල්ලන උපකරණය ඇජිටේටර්	01
03. අහල් 4 කපාට මල නොබැඳෙන වානේ	03
04. ස්පාක්ලර් වර්ගයේ පීඩන පෙරනය මල නොබැඳෙන වානේ	01
05. ප්‍රොසෙසිං ටැංකිය මල නොබැඳෙන වානේ	01
06. පෙර – සිසිල්කරන උපකරණය – ප්‍රී කූලර් මල නොබැඳෙන වානේ	01
07. වාෂ්ප සන්නිහවනය කරන උපකරණය මල නොබැඳෙන වානේ	01
08. ටර්පන්ටයින් සෙපරේටර් මල නොබැඳෙන වානේ	03
09. ලීටර් 1,000 ටර්පන්ටයින් දමන ටැංකි මල නොබැඳෙන වානේ	01
10. පෙරහන මල නොබැඳෙන වානේ	02
11. රෙසින් ගබඩා කරන ටැංකි කි. ග්‍රෑ. 1500 ජී.අයි.	02
12. ලීටර් 10,000 තෙල් ගබඩා කරන ටැංකි මෘදු වානේ	01
13. තෙල් සේවා ටැංකි ලීටර් 500 මෘදු වානේ	01
14. අහල් 2 තෙල් පොම්ප	03
15. අහල් 4 ගම් පොම්ප මල නොබැඳෙන වානේ	03
16. අහල් 2 වතුර පොම්ප	05
17. තෙල් පෙර උනුසුම් කරන උපකරණය	01
18. අහල් 1 තෙල් කපාට මල නොබැඳෙන වානේ	06
19. තෙල් ආපසු නොඑන කපාට මල නොබැඳෙන වානේ	04
20. ජලය ආපසු නොඑන කපාට	06
21. ෆැෂ් වේම්බර්ස්	02
22. දාහක	02
23. බ්ලෝවර්	01
24. ජල සිසිල් කුළුන	01

මෙම දේපල ශ්‍රී ලංකාවේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන උපාලි ඕගනයිසේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනාදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2005 ක් වූ ජුනි මස 13 වන දින පෙ. ව. 11.00ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2004.04.16 වන දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2004.03.25 වන දින දිනමිණ, ඩේලිනිවුස් සහ තිනකරන් යන පුවත් පත් බලන්න.

දේපලට පිවිසීම.– කොළඹ කොටුවේ සිට රත්නපුර –බදුල්ල මහාමාර්ගයේ බෙලිහුල්ඔය පසුකර 172/1 බෝක්කුව දක්වා පැමිණි විට මහා මාර්ගයේ දකුණු දෙසින් (Pines Oleo Rasin Project) යන නාමය යටතේ මෙම දේපල පිහිටා තිබේ.

ගෙවීමේ ක්‍රමය.– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුවේ.

ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාරක්) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු හා සෝෂක චේතනය රු. 500 සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත දී සී/ස සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතුවේ.

නිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. – ප්‍රධාන කළමනාකරු (නීති) සමාසහිත සෙලාන් බැංකුව, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාළු පාර, කොළඹ 03.

දුරකථන අංක 011 – 4701256, 011 – 2456258, 077 – 7736452

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 432/1, මවුන්ට් ප්ලසන්ට් ගාර්ඩන්ස්,
බෝවලවත්ත පාර, හිරිස්සගල, මහනුවර.

දුරකථන අංක 081 – 2217768, 071 – 4755974, 071 – 2755974, ෆැක්ස් 081 – 2217768

05 – 264/4

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : කේ/04/0479/කේවයි1/343.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.09.24 දින *ගැසට් පත්‍රයේ* සහ 2004.12.06 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, විසහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කටුගස්තොට, කහල්ල අංක 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහමිපත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2005.06.17 වෙනි දින පෙරවරු 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, මාවතුපොල පිහිටි ගිනිඅඹේන්න ලෙස හඳුන්වන ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. සී. ඕ. ද ලා මොටෝ විසින් සකසන ලද (මහනුවර දිස්ත්‍රික් උසාවියේ පී/5439 ලෙස වාර්තා ගොනු වී ඇත.) 1960.05.27 දිනැති හා අංක 1806 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 16 ක්වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග සහ පොදු මාර්ග පාවිච්චියට ඇති නීතිමය අයිතිය ද සමග වේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක එව්/586/06 හි ලියාපදිංචි වී ඇත.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
වැඩබලන සාමාන්‍යාධිකාරි.

2005 අප්‍රේල් මස 29 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.

05-266/7

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 4/7340 5/වයි4/076.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.12.17 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.02.22 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, විසහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කටුගස්තොට, කහල්ල අංක 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහමිපත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2005.06.17 වෙනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, පානදුම්බර ප්‍රාදේශීය සභා සීමාව තුළ කහල්ල ග්‍රාමයේ පුරාණ විහාර මාවතේ පිහිටි ගමගෙදරවත්ත සහ හල්ගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. එම්. තිලකරත්න විසින් සකසන ලද 1999.02.04 දිනැති හා අංක 305 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 11.06 ක්වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක ඊ 668/131 හි ලියාපදිංචි වී ඇත.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
වැඩබලන සාමාන්‍යාධිකාරි.

2005 අප්‍රේල් මස 29 වැනි දින,
ගාලු පාරේ අංක 269,
කොළඹ 3.
05-266/8

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 2/71247/බි2/753.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.07.11 දින *ගැසට් පත්‍රයේ* සහ 2004.07.09 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අවශ්‍ය යුතු පොලිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස, මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, ගම්පහ, උසාවිය පාර, සණස චතුරශ්‍රයේ අංක 15 හි බලයලත් වෙන්දේසිකාර ටී. එම්. එස්. පීරිස් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2005.06.04 වෙනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

උපලේඛනය

